www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජී 20 සමුලුව ආසන්නයේ යුරෝපා සංගම් ජාතීහු බෙදී වෙන් වෙති

## EU nations divided in run up to G20 summit

**ස්ටෙෆාන් ස්ටෙයින්බර්ග් විසිනි.**

2010 ජූනි 21

ලබන සතියේදී ටොරොන්ටෝහි පැවැත්වීමට නියමිත ජී20 සම්මන්ත්‍රනය සඳහා ඒකාබද්ධ ස්ථාවරයකට එලඹීමට, පසුගිය බ්‍රහස්පතින්දා බ්‍රසල්ස්හි රැස්වූ යුරෝපා සංගමයේ ජාතීන් 20 ක නායකයෝ අසමත් වූහ.

බ්‍රසල්ස්හි බ්‍රහස්පතින්දා රැස්වීම පැවැත්වුනේ 1930 ගනන්වල සිට මහාද්වීපයේ දැවැන්තම මූල්‍ය අර්බුදයේ සහ එක්සත් ජනපද පරිපාලනය විසින් එල්ල වෙන පීඩනයේ සෙවනැල්ල තුලය. පොදු ආර්ථික උපායමාර්ගයක් ඉදිරිපත් කරන්නට ඇති තම නොහැකියාව යුරෝපීය නායකයෝ සම්පූර්නයෙන්ම ඔප්පු කලහ.

මැයි මාසය පටන්ගැන්මේදී යුරෝපීය මූල්‍ය ක්‍රමය සම්පූර්න බිඳවැටීමක් අද්දර පැවති බව යුරෝපීය මහ බැංකුව (යුමබැ) විසින් මෑතකදී නිකුත් කල වාර්තාවක් සනාථ කලේය. නය බරින් මිරිකුනු ග්‍රීසියෙහි යෙදවූ තම ආයෝජනයන් හේතුවෙන් ප්‍රධාන යුරෝපීය බැංකු ගනනාවක් බංකොලොත්භාවයට මුහුනදීමත් සමග, 2008 හේමන්තයේදී ලේමන් බ්‍රදර්ස් බිඳවැටීමෙන් පසු ක්ෂනිකව ඇතිවූ තත්වයට වඩා වැඩි බරපතල වාතාවරනයකට යුරෝපා බැංකු මුහුන දී සිටින බව යුමබැ වාර්තාව ප්‍රකාශ කරයි.

යුරෝපීය කලාපය තුල ඇතිවිය හැකිවූ බංකොලොත්භාවයන් සඳහා යුරෝ බිලියන 750 ක දැවැන්ත මුදා ගැනීමේ පැකේජයකට එකඟවීමට, මැයි 8-9 සති අන්තයේ හදිසියේ කැඳවූ රැස්වීමකදී යුරෝපීය නායකයන් ගත් ක්ෂනික ක්‍රියාමාර්ගය හේතුවෙන් යුරෝපීය බැංකු ක්‍රමය බිඳවැටීම අවසන් මොහොතේදී වලක්වා ගැනුනි. එතැන් පටන්, තත්වය සමතුලනය කිරීමට අබලන් වූ යුරෝපීය ආර්ථිකයන්ගෙන් රාජ්‍ය බැඳුම්කර බොහෝ සංඛ්‍යාවක් මිලදී ගත් බව යුමබැ පිලි ගනියි. කෙසේවුවත්, පසුගිය සතියේදී ඩොලරයට එරෙහිව වසර හතරක් තුල පහලම අගයට යුරෝව ඇදවැටීමත් සමග, මූල්‍ය වෙලඳපොලෙහි නැතිගැන්ම නොවෙනස්ව පවතී.

යුරෝපයෙහි වඩාත් විවෘත ආර්ථිකයන් හතර තුල විදේශ බැංකුවල සහභාගිත්වයෙහි ප්‍රමානය ගෙනහැරපාන්නාවූ නව සංඛ්‍යාලේඛන තුලින් යුරෝපීය කොටස් වෙලඳපොලෙහි නුරුස්නා ස්වභාවය වැඩි දියුනුවී ඇත. අන්තර්ජාතික බේරුම් කිරීමේ බැංකුවේ නවතම කාර්තුවේ වාර්තාවට අනුව, ස්පාඤ්ඤ, අයර්ලන්ත, පෘතුගාල සහ ග්‍රීක ආර්ථිකයන්හි මුලු විදේශ බැංකු සහභාගිත්වය ඩොලර් ට්‍රිලියන 2 කට වඩා වැඩි අගයක් ගනී. එයින් අඩක්ම ජර්මන් සහ ප්‍රන්ස බැංකු සතුවේ.

බැංකු ආරක්ෂා කිරීමට තවදුරටත් දැවැන්ත රාජ්‍ය ඇපදීම් අවශ්‍ය වනු ඇති බවට යුරෝපයේ ප්‍රධාන ආර්ථික විශේෂඥයෝ දැන් අනතුරු අඟවති. බ්‍රසල්ස්හි යුරෝපා සංගමයේ සමුලුව අභියසදී, රාජ්‍ය බංකොලොත්භාවයෙන් වැලකීමට ජාමූඅ න් හදිසි නය ඉල්ලුම් කිරීමේ අද්දර ස්පාඤ්ඤය පසුවන බව ප්‍රතික්ෂේප කරන්නට ස්පාඤ්ඤ අගමැති සහ යුරෝපා සංගමයේ දේශපාලකයෝ ගනනාවක් උත්සාහ කලහ. තම වෙබ් අඩවියෙන්, මූල්‍ය විශේෂඥ වොල්ෆ්ගැන්ග් මන්චාවු මෙසේ අනතුරු ඇඟවීය. "අපගේ යුරෝපීය රාජ්‍ය නය අර්බුදය ගැන යටින් දිවෙන ගැඹුරු සත්‍යය ගෝලීය ආයෝජකයෝ තේරුම්ගෙන සිටිති - එහි න්‍යෂ්ඨියෙන්ම, එය කිසිසේත්ම රාජ්‍ය නය අර්බුදයක් නොවන නමුත් පුපුරන්නට ආසන්නව ඇති දැඩිව එකිනෙක හා බැඳුනු බැංකු අර්බුදයකි."

දෙවැනි බැංකු කඩාවැටීමක් ගැන වැඩෙන අවදානමට අමතරව, එක් යුරෝපීය ආර්ථිකයකට පසුව අනෙක විසින් එකඟවුන විශාල කප්පාදු වැඩසටහන් ආර්ථික වර්ධනයේ ගෙල සිරකරන්නට සහ යුරෝපයේ හා ලෝකය පුරා ආර්ථිකයන් නව මන්දාවධමනයක ගිල්වන්නට තර්ජනය කරන බවට ද ආර්ථික විශේෂඥයෝ අනතුරු අඟවමින් සිටිති. "එම 30 දශකයේ හැඟීම" නමින් ජූනි 17 නිව්යෝක් ටයිම්ස් වෙත ජර්මනියේ සිට කොලමක් ලියන පෝල් කෘග්මන් "මූල්‍ය සාධර්මිකතාව කෙරෙහි කැපවෙමින් වයිමාර් ජනරජයේ අවසාන ඉරනම තීන්දු කරමින් අවසන් කෙරුනු, 1930 සිට 1932 දක්වා චාන්ස්ලර් ධුරය හෙබ වූ, හෙන්රිච් බෲනින්ගේ ප්‍රතිපත්තිවලට සමාන්තරව යෑමක් සමහර විද්වතුන් දකින" බව සඳහන් කරයි.

විශාල කප්පාදු වැඩසටහන් නිසා දෙවැනි ආර්ථික මන්දාවධමනයක් ඉක්මනින් ඇති වීමේ බියසංකා ඇත්තෙන්ම සත්‍යයක් වන නමුත්, කෘග්මන් විසින් ඉදිරිපත් කල මෙම තර්කයන් යොදාගන්නේ, තමන්ගේ ප්‍රධාන විරුද්ධවාදීන් වන යුරෝපයේ සහ චීනයේ වියදමින් තමාගේම ආර්ථික අර්බුදයට පිලියම් සපයන්නට උත්සාහයක නිරතවන එක්සත් ජනපද පරිපාලනයට වඩා වැඩි කෙනෙක් නොවේ.

මෙම මාසය මුලදී එක්සත් ජනපදය සහ යුරෝපය අතර ගැටුම ඉස්මතු වූයේ, යුරෝපය සඳහා වන ආර්ථික ප්‍රතිපත්තියක් ගැන යුමබැ සභාපති ෂෝන්-ක්ලෝඩ් ට්‍රයිචෙට්, එජ භාන්ඩාගාර ලේකම් තිමොති ගෙයිත්නර් සමග නොඑකඟතාවකට එලඹීමේදීය. ඉල්ලුම සඳහා පෙලඹවීමට යුරෝපීය ආර්ථිකයන්හි ආයෝජන ඉහල නැංවීම සඳහා ගෙයිත්නර් ආයාචනා කරන අතරේ ට්‍රයිචෙට්, තද මූල්‍ය සංවරයක් සහ කප්පාදු වැඩපිලිවෙලක් වෙනුවෙන් තර්ක කලේය.

තමන්ගේ ප්‍රධාන විරුද්ධවාදීන්ට එරෙහිව වෙලඳ යුද්ධයේ ආධාරකයක් ලෙස අනෙකුත් අන්තර්ජාතික මුදල් ඒකක සමග සංසන්දනයේදී ඩොලරයේ දුර්වල බව එක්සත් ජනපදය කාලයක් පුරා පාවිච්චි කරමින් සිට තිබුනි. යූරෝවේ පහතවැටීම සහ මහාද්වීපය පුරා බලපැවැත්වෙන කප්පාදු පිලිවෙත්වල ප්‍රතිපලයක් ලෙස පරිභෝජනයේ හැකිලීම, එකට එක්වීම, ඇමෙරිකානු වෙලඳ හා ව්‍යාපාර අවශ්‍යතාවලට හානිකර විය හැකි බවට එක්සත් ජනපද පරිපාලනයේ වර්තමාන සැලකිල්ල යොමුව ඇත.

ජී20 සමුලුවට පෙර ලෝක නායකයින්ට යැවූ ලිපියකින්, විශේෂයෙන්ම චීනයට සහ ජර්මනියට, එක්සත් ජනපද ජනාධිපති බැරැක් ඔබාමා අනතුරු ඇඟවීය. ඔවුන්ගේ අපනයන අතිරික්තයන් හසුරුවන ලෙසත්, ඉල්ලුම සඳහා පෙලඹවීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් ඉල්ලා සිටියේය. "දුර්වල පුද්ගලික අංශයේ ඉල්ලුම සහ දැනටමත් විශාල අපනයන අතිරික්තයක් සහිත සමහර රටවල් විසින් නොනවත්වා අපනයන මත තබන ඉහල විශ්වාසය ගැන මාගේ සැලකිල්ල යොමුව ඇත." ඔබාමා ලිවීය.

ඔවුන්ගේ සාකච්ඡා අවසානයේදී, ගිය බ්‍රහස්පතින්දා බ්‍රසල්ස්හිදී යුරෝපීය නායකයන් විසින් එකඟ වුන කරුනු, ඔවුන් මුහුනපාන දැවැන්ත ආර්ථික සහ මූල්‍ය ගැටලු සමග කිසිදු සම්බන්ධයක් නොදක්වන අතර සත්තකින්ම ඒවා යුරෝපීය දේශපාලන කවයන් තුල පවතින අසමගිය පමනක් මතුකර පෙන්වයි.

යුරෝපීය කලාපයේ එකමුතුව වන ජාතීන් 16 ක ආර්ථිකයන් තුලට අතපොවන්නට විශේෂ බලතල සහිත "ආර්ථික ආන්ඩුවක්" පිහිටුවීම සඳහා වූ ප්‍රන්ස සහ ස්පාඤ්ඤ ආන්ඩුවල සහයෝගය ලත් යෝජනාවට එකඟවන්නට ජාතීන් 27 ක නායක කන්ඩායම අපොහොසත් විය. ක්‍රමානුකූල සමුලු පවත්වන්නටත්, ස්ථිර ලේකම් කාර්යාලයක් පවත්වාගෙන යාමටත් බොහෝ කාලයක සිට ප්‍රන්ස ජනාධිපති නිකලස් සර්කෝසි යුරෝපීය කලාපයට බල කරමින් සිටියේය. යෝජනාව පරාද වූයේ මූලිකවම ජර්මානු චාන්ස්ලර් ඇන්ජෙලා මර්කල් එයට එරෙහි වීම නිසාය. ඇය ඒ සඳහා සහයෝගය ලබා ගත්තේ යුරෝපීය එකමුතුවට එරෙහි ප්‍රසිද්ධ විරුද්ධවාදියෙක් වන නව බ්‍රිතාන්‍ය අගමැති ඩේවිඩ් කැමරන්ගෙනි.

ඒ වෙනුවට, ආර්ථික පරිපාලනය පිලිබඳ අනාගත යෝජනාවල් ගෙන ඒමේ කටයුත්ත යුරෝපීය කොමිසමට බාරදුන් යුරෝපා සංගමයේ රාජ්‍ය නායකයෝ කැප වීමකින් තොර අභිප්‍රාය ප්‍රකාශනයකට එකඟවූහ. ඊට අමතරව, යුරෝපා සංගමයේ නායකයන් ජාතීන් 27-කන්ඩායමේ තරගකාරිත්වය ඉහල නංවන දස-අවුරුදු සැලැස්මක් අනුමත කලත්, එහි තම අරමුනු සාක්ෂාත් කරගැනීමට විශේෂිත වූ වැඩපිලිවෙල නොපැහැදිලි විය.

එක්සත් ජනපද පරිපාලනය විසින් බැංකු හඳුන්වා දී ඇති පරීක්ෂන අනුව යමින් යුරෝපීය බැංකු සඳහා ද ඊනියා "ආතති පරීක්ෂන" ප්‍රසිද්ධ කිරීමට ද යුරෝපා සංගමයේ සමුලුව එකඟවිය. සත්‍ය වශයෙන්ම, යුරෝපයේ ප්‍රධාන බැංකු 25 ක් සඳහා සකස්කල පරීක්ෂන විශේෂිතවම තෝරාගෙන තිබේ. ග්‍රීක නය අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය බැඳුම්කරවල වටිනාකම පහල වැටීමත් සමග ගැලපුන වර්තමාන අගයයන් ඒවායේ අඩංගු කර නැත. ස්පාඤ්ඤ ඉතිරිකිරීමේ බැංකු සහ මහාද්වීපයේ බොහෝ නොගෙවූ නය හිරවී ඇති දිගුකාලයක සිට ලෙඩවුන ජර්මන් රාජ්‍ය බැංකුවලින් වැඩි කොටසක් වැනි කුඩා යුරෝපීය බැංකුවලින් වැඩි කොටසක් "ආතති පරීක්ෂන" වලට ඇතුලත්ව නැත.

ටොරොන්ටෝහිදී ජී20 සමුලුවට යුරෝපීය මූලාරම්භයන් ලෙස ඉදිරිපත් කිරීමට සමුලුවේදී සාකච්ඡා කෙරුනු අනෙකුත් වැඩපිලිවෙලට, මූල්‍ය ගනුදෙනු මත බද්දක් (මීට මර්කල් සහ සර්කෝසිගේ සහයෝගය ලැබුනි) සහ ඊලඟ මූල්‍ය අර්බුදය සඳහා වෙන් කර තබන අරමුදලක් සඳහා බැංකු මත විශේෂිත බද්දක් ඇතුලත් විය. මෙම යුරෝපා සංගමයේ වැඩපිලිවෙල කිසිදු වර්ධනයක් බලාපොරොත්තු විය නොහැකි ජීවයෙන් තොර වැඩපිලිවෙලක් ලෙසට දැනටමත් මාධ්‍ය විචාරකයන් විස්තර කර ඇත.

බ්‍රිතාන්‍ය අගමැති සහ ලන්ඩන් බැංකු ප්‍රජාව විසින් නායකත්වය ලද විරෝධතාවය අභියස මූල්‍ය ගනුදෙනු සඳහා වූ බද්ද ගැන එකඟතාවයකට ඒමට යුරෝපා සංගමය අසමත් විය. බැංකු මත සාමාන්‍ය බද්ද වන දෙවැනි වැඩපිලිවෙලට ජපානය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, චීනය සහ බ්‍රසීලය වැනි ප්‍රධාන ජී20 රටවල් ගනනාවක් විරුද්ධ විය.

යුරෝපයේ ඉහල නිලයන්ගේ වර්තමාන අසමගියේ පැහැදිලිම ඇඟවුම වූයේ, බ්‍රසල්ස් රැස්වීමේදී වඩා ස්ථිර "යුරෝ-සැක කරන්නෙකු" වන ඩේවිඩ් කැමරන් හට ලැබුනු උනුසුම් පිලිගැනීමයි.

යුරෝපා සංගමයේ කොමිසමේ සභාපති ජෝසෙ මැනුවල් බරාසෝ විසින් පිරිනැමුනු පූර්න ඉංග්‍රීසි උදෑසන ආහාරය ගැන තමන් "සුහදශීලීව පුදුමයට" පත්වුන බව කැමරන් ප්‍රකාශ කලේය. සමුලුව අවසනදී, "බ්‍රිතාන්‍යය සඳහා හොඳ ප්‍රතිපල" ලබාදුන් "ශක්තිමත් ඒකමිතියක්" වෙනුවෙන් කැමරන් සමුලුවට ප්‍රශංසා කලේය. ඒ සමගම, තවදුරටත් සිදුවන මහා පරිමාන ඒකාබද්ධවීමක් වලක්වන්නට තමන් ක්‍රියාකරන බව කැමරන් අවධාරනය කලේය.

අනෙකුත් යුරෝපා සංගමයේ කොන්සර්වැටිව් නායකයන් දැනදැනම මගහරිමින්, සමුලුව අරඹන්නට මොහොතකට පෙර කැමරන්, මිචල් කමින්ස්කි සමග සාකච්ඡා පැවැත්වීය. කමින්ස්කි යනු අතිධාවනකාරී ස්වෝත්තමවාදී සහ යුරෝපා-විරෝධී ඊසීආර්ජී ය (යුරෝපීය කොන්සර්වැටිව් සහ ප්‍රතිසංස්කරනවාදී කන්ඩායම) මෙහෙයවන පෝලන්ත MEP කෙනෙකි. ගිය වසරේදී කැමරන්, ටෝරිවරුන්ව ප්‍රධාන යුරෝපීය කොන්සර්වැටිව් කන්ඩායම වන යුරෝපීය මහජන පක්ෂයෙන් ඉවත්කර ඊසීආර්ජී ට සම්බන්ධ කිරීමට තීරනය කලේය.

© www.wsws.org